# ඇබෑර්තු

SRI LANKA STANDARDS INSTITUTION
GUARDIAN OF QUALITY

## ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)

## විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

## සහකාර අධ්‍යක්ෂ - කළමනාකරණ කාණ්ඩය (MM 1-1)

## සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ)

**සුදුසුකම්**

**බාහිර**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ආයතනයකින් ලබාගත් විද්‍යාවේදී විෂය ධාරාවෙහි විශේෂ උපාධියක් (වසර 04) ක හෝ පංති සාමාර්ථයක් සහිතව සාමාන්‍ය උපාධියක් ( වසර 03 ක)

**සහ**

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ වසරක සේවා පළපුරුද්ද

(විද්‍යා විෂය ධාරාවෙහි පහත සඳහන් විෂයන්ගෙන් එක් විෂයක්වත් හදාරා තිබිය යුතුය.

භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ආහාර විද්‍යාව, රෙදිපිළි, ක්ෂුද්‍ර ජීවී විද්‍යාව, පරිසර විද්‍යාව, ධීවර, කෘෂිකර්මය, ජීව විද්‍යාව, ජෛව තාක්ෂණය, අණුක ජීව විද්‍යාව, ගණිතය හෝ සංඛ්‍යානය

**අභ්‍යන්තර (පහත 01 හෝ 02)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය වන සුදුසුකම් ලබා තිබීම.
2. මෙම තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයෙහි කතිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ අවම වශයෙන් පස් වසරක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

## සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු)

**බාහිර**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ආයතනයකින් ලබාගත් ඉංජිනේරු උපාධියක් (වසර 04) ක

**සහ**

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ වසරක සේවා පළපුරුද්ද

**අභ්‍යන්තර (පහත 01 හෝ 02)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය වන සුදුසුකම් ලබා තිබීම.
2. මෙම තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයෙහි කතිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ අවම වශයෙන් පස් වසරක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය**

අයදුම්පත් කැඳවීමෙන් පසු ලිඛිත තරඟකාරී විභාගයක ප්‍රතිඵල මත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. පහත දැක්වෙන විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි කොටස් දෙකකින් සමන්විත ( පැය 03 ක) ප්‍රශ්න පත්‍රයක් ලබා දෙනු ලැබේ.

- ඉංග්‍රීසි භාෂා ප්‍රවීණත්වය
- අභියෝග්‍යතාව

**සෑම අයදුම්කරුවෙකුම**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ රාජකාරී මැනවින් ඉටු කිරීම සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
- විශිෂ්ට සදාචාරාත්මක චරිතයක් විය යුතුය.

**වැටුප් පරිමාණය**

LKR 53,175.00 – 16 x 1,375.00 – LKR 75,175.00

**වයස**

අවුරුදු 22 කට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය (අභ්‍යන්තර අයදුම්කරුවන්ට ඉහත වයස් සීමාව අදාළ නොවේ)

**අනෙකුත් වරප්‍රසාද**

1. ලබානොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවනු ලැබේ.
2. ජීවිතාරක්ෂණ ආවරණය හා වෛද්‍ය රක්ෂණාවරණයක් හිමි වේ.
3. සීමාවකට යටත්ව බාහිර වෛද්‍ය වියදම් ගෙවනු ලැබේ.
4. මහා භාණ්ඩාගාරය මගින් අනුමත වාර්ෂික දිරි දීමනා ගෙවනු ලැබේ.
5. පිළිගත් වෘත්තීයමය වටපිටාවක රැකියාව කිරීමේ අවස්ථාව.
6. සන්නිවේදන දීමනාව.

සම්පූර්ණ නම, වයස, අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් අදාළ විස්තර ඇතුළත් අයදුම්පත්, සහතිකවල පිටපත් සමඟ ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සඳහන් කරමින් අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, නො 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත, කොළඹ 08 යන ලිපිනයට 2025-02-10 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුය. රාජ්‍ය අංශයේ ආයතනවල අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය. අයදුම්කරන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව සටහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය,**
**දුරකථන 011-2671567 -72**